ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛ - 01/2024

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්,

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

2024.03. 28

## තරුණ ව්‍යවසායකයින් බලගැන්වීමේ ජාතික වැඩසටහන - 2024

### 1. පරමාර්ථය සහ ඉලක්ක ප්‍රජාව

වර්තමානයේදී තරුණ තරුණියන් මුහුණ දෙන ප්‍රධානතම අභියෝගය ආර්ථිකව ශක්තිමත් වීමයි. ඒ සඳහා ඔවුන්ගේ දැනුම කුසලතා සහ ආකල්ප සංවර්ධනය කරමින් රටේ නිෂ්පාදන ක්‍රියාවලිය බලගැන්වීම සඳහා ව්‍යවසායකත්ව කුසලතා ඔප් නැංවීමට ජාතික වැඩසටහනක් රට පුරා ක්‍රියාත්මක කිරීමට අප අමාත්‍යාංශය මෙම වර්ෂයේදී සැලසුම් කර ඇත. සෑම ග්‍රාම නිලධාරී වසමක් තුළින්ම අවම වශයෙන් තරුණ තරුණියන් දෙදෙනකු බැගින් තෝරා ගෙන ඔවුන්ට සමස්ත පද්ධතියේම සහයෝගය ලබා දීමට අවශ්‍ය ඉඩහසර සලසා දීම එහි ප්‍රධාන අරමුණ වී පවතී. ව්‍යාපාර ආරම්භ කිරීමට බලාපොරොත්තුවන සහ දැනටමත් ව්‍යාපාරවල නිරත තරුණ පිරිස මෙම වැඩසටහන සඳහා ඉලක්කගතකර තිබේ. තනි පුද්ගලයින් ලෙස හෝ සුදුසු පරිදි සමූහ ලෙස ඔවුන්ට අවශ්‍ය සහයෝගය මග පෙන්වීම සහ පුහුණුව ලබා දීමට අපේක්ෂා කෙරේ.

### 2. සුදුසුසන් තෝරා ගැනීම

රට පුරා විසිරුණු වයස අවුරුදු 18 සිට 40 දක්වා මිලියන අටකට ආසන්න තරුණ පිරිස අතුරින් ගැළපෙන කණ්ඩායම තෝරා ගැනීම සැබවින්ම අභියෝගයකි. ඒ සඳහා විවිධ මාධ්‍යයන් භාවිතා කිරීමට නියමිතය.

2.1. දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම්ගේ නායකත්වයෙන් යුතුව නිලධාරීන්ගේ සහයෝගය ලබා ගැනීම
2.2. විවිධ සංවිධානවල සහ පුද්ගලයින්ගේ සහයෝගය ලබා ගැනීම
2.3. නව මාධ්‍ය යොදා ගැනීම

මෙහිදී වැඩි සඵලදායකත්වයක් ඇති කර ගැනීමට නව මාධ්‍යයන් ලෙස සමාජ මාධ්‍යයන් භාවිතා කිරීම අත්‍යාවශ්‍ය වන්නේ වර්තමාන තරුණ පිරිස එම මාධ්‍යයන් බහුලව භාවිතා කිරීම හේතුවෙනි. තරුණ පිරිස ආකර්ෂණය කරගත හැකි අයුරින් නිර්මාණශීලී සමාජ මාධ්‍ය ප්‍රවර්ධනයක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් දියත් කිරීමට කටයුතු යොදා ඇත. ඒ සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදනවලට යටත්ව වෘත්තීය ඩිජිටල් මාධ්‍ය ආයතනයක හෝ පුද්ගලයෙකුගේ සහයෝගය ලබා ගැනීම සුදුසුය.

### 3. ව්‍යාපාර අවස්ථා පිළිබඳව අවබෝධයක් ලබා දීම

ව්‍යාපාර ආරම්භ කිරීමට අපේක්ෂිත අය සඳහා තනි තනිව හෝ සාමූහිකව ආරම්භ කිරීමට හැකි ව්‍යාපාර අවස්ථා පිළිබඳව වැඩමුළු සහ මාර්ගගත දැනුවත් කිරීම් සිදුකිරීමට කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ නිලධාරීන්හට පවරා තිබේ. එහිදී ප්‍රාදේශීය විභවතාවයන් සහ වෙළඳපොළ අවස්ථාවන් සලකා බලමින් ඔවුන්ට ව්‍යාපාර අදහස් ලබා ගැනීමට සුදුසු ආයතනවල සේවාවන් හඳුන්වා දිය යුතුය. නිදසුනක් ලෙස ශ්‍රී ලංකා පොල් සංවර්ධන මණ්ඩලය මගින් ප්‍රවර්ධනය කරන ව්‍යාපාර අවස්ථා පිළිබඳව දැනුවත් කිරීම හඳුන්වා දිය හැකිය. එමෙන්ම මාර්ගගත ආකාරයට මෙම දැනුවත් කිරීම් සිදුකිරීමෙන් විශාල පිරිසක් අවම පිරිවැයකින් දැනුවත් කිරීම සිදු කළ හැකිය.

## 4. ව්‍යාපාර ආරම්භ කිරීමට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දීම

ව්‍යාපාරික වශයෙන් නොයෙකුත් ආර්ථික කටයුතු ප්‍රවර්ධනය කරන ආයතනවලින් පවත්වනු ලබන නොයෙකුත් පුහුණු සහ උපදේශනාත්මක සේවාවන් වෙත තෝරාගත් තරුණ තරුණියන් යොමු කිරීම මෙමගින් අපේක්ෂා කෙරේ. තවද, ඒකාබද්ධ ප්‍රවේශයකින් ග්‍රාමීය මට්ටමින් තරුණ තරුණියන් සවිබල ගැන්වීම මෙමගින් සිදු කළ හැකිය. මෙහිදී මුදල් වැය කර ලබා ගත යුතු, එහෙත් ආර්ථික අපහසුතා නිසා එසේ කිරීම අපහසු අයට යම් සීමාවකට යටත්ව මූල්‍ය සහනයක් ලබා දීමට මෙම වැඩසටහන යටතේ අවකාශ පවතී. ඒ සඳහා ඔබේ නිර්දේශයන් ඉතා වැදගත් කොට සලකන අතර පිළිගත් සහ ලියාපදිංචි ආයතන ඒ සඳහා යොදා ගත යුතුය.

## 5. වෙළඳපොළ අවස්ථා සලසා දීම

නව නිෂ්පාදනයක් හෝ අලුතින් ව්‍යාපාරයක් ආරම්භ කළ පසුව එම පුද්ගලයින් මුහුණ දෙන මූලිකම ගැටලුවක් වන්නේ ප්‍රමාණවත් අලෙවි ආදායමක් නොලැබීමයි. ඒ සඳහා නිසි අත්දැකීමක් ලබා ගැනීමටත් දුෂ්කරතා මෙන්ම අභිහිරි අවස්ථාවන්ට මුහුණ දීමකින් තොරව තම නිෂ්පාදන ඉලක්ක වෙළඳපොළට හඳුන්වා දීමටත් ප්‍රාදේශීය වශයෙන් ඉතා කුඩා ප්‍රමාණයේ වෙළඳපොළ/ප්‍රදර්ශන පැවැත්වීම ඉතා වැදගත් බව ඔබටද වැටහී ඇති බව විශ්වාසය. එනයින් ප්‍රාදේශීයව අවම වශයෙන් මාසිකව හෝ කුඩා වෙළඳපොළක් නිර්මාණය කර දීමට නිලධාරීන් කටයුතු කරන අතර, එය වඩ වඩාත් සාර්ථක කර ගැනීමට ඔබගේ මැදිහත්වීම මගපෙන්වීම ඉතා වැදගත් ය.

එමෙන්ම, ආරම්භ කර ඇති ව්‍යාපාරවලද සංවර්ධනය උදෙසා අලෙවි ආදායම ඉහළ නංවා ගත යුතුය. එබැවින් පොදුවේ කුඩා ව්‍යාපාරවල නිරත තරුණ ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන අලෙවි කර ගැනීමට පහත සඳහන් ක්‍රියාකාරකම් සැලසුම් කර ඇත.

5.1. ප්‍රාදේශීය, දිස්ත්‍රික් සහ පළාත් මට්ටමින් අලෙවි ප්‍රදර්ශන පැවැත්වීම
5.2. ගැනුම්කරුවන්, විකුණුම්කරුවන් හමු සංවිධානය කිරීම
5.3. මාර්ගගත වෙළඳාමට යොමු කිරීම
5.4. අපනයන වෙළඳාමට සම්බන්ධ කිරීම
5.5. අලෙවි ප්‍රවර්ධනයට අදාළ පුහුණු සැසි පැවැත්වීම, ආයතන සම්බන්ධීකරණය සහ උපදෙස් ලබා දීම

## 6. ව්‍යාපාර සැලසුම් සකස් කිරීම

ඉලක්කගත අලෙවි ආදායම් පදනම් කරගෙන තම තමන්ගේ ව්‍යාපාර සංවර්ධනය කරගත යුත්තේ කෙසේද යන්න පැහැදිලි කර ගැනීමට සෑම තරුණ ව්‍යාපාරිකයෙකුටම ව්‍යාපාර සැලැස්මක් සකස් කර ගැනීමට මග පෙන්වීම මෙම වැඩසටහනේ ප්‍රමුඛ කාර්යභාරයකි. ව්‍යාපාරවල ස්වභාවය අනුව අදාළ සැලසුම් සකස් කර දීමට වග බලා ගත යුතුය. එම සැලසුම් පාදක කර ගෙන පහත පරිදි ක්‍රියා කළ යුතුය.

6.1. අලෙවි ආදායම ලබා ගැනීමට වැදගත් වන නිෂ්පාදන හඳුනාගෙන ඒවා සංවර්ධනය කිරීමට මගපෙන්වීම
6.2. අලෙවි සැලසුමට අදාළව නිෂ්පාදන ධාරිතාවන් සකස් කරගැනීමට අවශ්‍ය දැනුම, තාක්ෂණය, යන්ත්‍රෝපකරණ සපයා ගැනීමට උපදෙස් තොරතුරු සහ අදාළ ආයතනවල උපදේශකයින් සම්බන්ධීකරණය
6.3. නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමට අවශ්‍ය සහාය ලබාදීම
6.4. නිෂ්පාදන පිරිවැය අවම කරදීමට අවශ්‍ය ඵලදායිතාවයන් ඉහළ නැංවීමට සහාය වීම
6.5. ව්‍යාපාර සැලැස්මට අනුව මූල්‍ය පහසුකම් ලබා ගැනීමට බැංකු සම්බන්ධීකරණය
6.6. ඉලක්ක සාක්ෂාත් කරන ව්‍යාපාරිකයින් දිරි ගන්වමින් අත්‍යාවශ්‍ය අවස්ථාවලදී මූල්‍ය සහාය ලබා දීම

## 7. ව්‍යවසායකත්ව කුසලතා ඉහළ නංවමින් ධාරිතා සංවර්ධනය කිරීම

තෝරාගත් සෑම තරුණ තරුණියකටම ව්‍යාපාරයක් මෙහෙයවීමට හැකි අයුරින් කළමනාකරණ, නායකත්ව සහ ව්‍යවසායකත්ව කුසලතා වැඩි දියුණු කිරීමට පහත සඳහන් ක්‍රියාකාරකම් සැලසුම් කර තිබේ.

7.1. පුහුණු වැඩසටහන් පැවැත්වීම
7.2. සමාජ මාධ්‍ය මගින් දැනුවත් කිරීම සහ අත්දැකීම් හුවමාරුව
7.3. මාර්ගගත වැඩසටහන් අඛණ්ඩව පැවැත්වීම
7.4. කණ්ඩායම්ගත කිරීම
7.5. ඇගැයීම

## 8. ක්‍රියාත්මක කිරීම සහ පසුවිපරම් කිරීම

මේ වර්ෂය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන සහ ඉලක්කයන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් වෙන්කර ඒවාට අනුරූප වනසේ එක් එක් කොට්ඨාසයට තරුණ ව්‍යවසායකයින් සංවර්ධනය කරන සැලැස්මක් සකස් කර ඔබගේ නිර්දේශ මත අමාත්‍යාංශයේ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය වෙත යොමු කරන ලෙස එම අංශයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල නිලධාරීන්ට පවරා ඇත. (අදාළ සැලැස්මේ ආකෘතියක් ඇමුණුම 01 මගින් දක්වා ඇත.) අනෙකුත් පාර්ශවකාර ආයතන නිලධාරීන් සමග එක්ව ඔබේ මගපෙන්වීම අනුව අඛණ්ඩව හා විධිමත්ව තම රාජකාරි කටයුතු ඔවුන් විසින් ඉටු කළ යුතුය.

කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ දිස්ත්‍රික් කාර්යාලයේ නිලධාරීන් විසින් ප්‍රාදේශීය මට්ටමින් මෙම වැඩසටහන කරගෙන යෑමට අවශ්‍ය සහාය මගපෙන්වීම සිදු කරනු ලබයි. සියලුම සැලසුම්, ව්‍යාපෘති යෝජනා සහ ප්‍රගතිය අංශයේ අභ්‍යන්තර තොරතුරු හුවමාරු පද්ධතිය වෙත ඇතුළත් කළ යුතුය. එමගින් දෛනිකව ප්‍රගතිය මැන බැලීමට හැකි බැවින් එය යාවත්කාලීන කිරීම සියලුම නිලධාරීන්ගේ වගකීම වන්නේය.

ඊට පරිබාහිරව මාසිකව සහ ත්‍රෛමාසිකව ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වා සමස්ත වැඩසටහනේ ප්‍රගතිය විමසා බලනු ඇත. ඔබගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය මට්ටමේ රැස්වීම් වලදීද මෙම වැඩසටහනේ ප්‍රගතිය මෙන්ම ගැටලු විසඳීම සඳහා අවධානය යොමු කිරීම මැනවි.

තවද, වැඩසටහනේ සාර්ථකත්වය වෙනුවෙන් පාර්ශවකරුවන් සම්බන්ධ කර දීමට ඔබේ දායකත්වය අතිශයින් වැදගත් වනු ඇත. තවද, මෙම නිලධාරීන්ගේ සෘජු අධීක්ෂණය ඔබ විසින් සිදුකරන බැවින් බැහැරයාම් අනුමත කරන්නේ නම් ඒවා අදාළ සැලැස්මට අනුකූල වනසේ පමණක් ලබා දීම සුදුසුය. එමෙන්ම වෙනත් රාජකාරිවලට නිලධාරීන් යොදා ගන්නේ නම් ඒ බව අමාත්‍යාංශය දැනුවත් කර මෙම රාජකාරිවලට බලපෑමක් ඇති නොවන ලෙස යොදා ගන්නේ නම් මැනවි.

මෙම ජාතික වැඩසටහන ඔබගේ දිස්ත්‍රික්කයේ/ කොට්ඨාසයේ සියලුම ග්‍රාම නිලධාරි වසම් තුළ සාර්ථකව ක්‍රියාත්මක කර ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කර ගැනීමට තරුණ ජවය ලබා ගැනීමට මැදිහත් වන්නේ නම් එය තරුණ ව්‍යවසායකත්වය ඉහළ නංවා ගැනීමට මහඟු පිටිවහලක් වනු නොඅනුමානය.

**කේ.මහේසන්**
**ලේකම්**
**ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය**